**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි මාර්ග) - 2015**

---

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි මාර්ග) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2014 නොවැම්බර් 05 දින එළඹි අංක 3171 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය, 2015 මැයි 28 දිනැති අංක 3222 - එස්ආර්අයි හා 2015 දෙසැම්බර් 11 දිනැති අංක 3226 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ වැඩසටහනේ කාලය**

---

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වන්නේ, ග්‍රාමීය ප්‍රජාව හා සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමයි. ජාතික හා පළාත් මාර්ග අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම එහි දිගුකාලීන බලපෑම වන අතර එහි අවසාන ප්‍රතිඵලය ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම වේ. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල විෂය පථය යටතේ පළාත් හා ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 3,130 ක් හා දකුණු, සබරගමුව, මධ්‍යම, උතුරු මැද හා වයඹ පළාත්වල හා බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග කිලෝමීටර් 400 ක් පුනරුත්ථාපනය කිරීම ආයෝජන වැඩසටහනට ඇතුළත් වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 117,780 කට සමාන එජඩො මිලියන 906 ක් වන අතර ඉන් රු.මිලියන 104,000 කට සමාන එජඩො මිලියන 800 ක් විවිධ කොටස් මූල්‍යායන පහසුකම යටතේ සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉන් පළමු කොටස් 03 යටතේ රු.මිලියන 52,910 කට සමාන එජඩො මිලියන 407 ක් මූල්‍යායනය කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දක්වා වෙනම ණය ගිවිසුම් 05 ක් අත්සන් කර තිබුණි. අනෙකුත් ණය ගිවිසුම් වෙනත් කොටස් 03 ක් යටතේ රු.මිලියන 51,090 කට සමාන එජඩො මිලියන 393 ක් මූල්‍යායනය කිරීම සඳහා 2016 හා 2017 වර්ෂවලදී අත්සන් කිරීමට අපේක්ෂිතය. වැඩසටහන එහි කටයුතු 2014 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 මාර්තු 30 වනවිට නිමකිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන

පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහන් වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක අත්තිකාරම සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්‍ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

සිවිල් වැඩ පිළිබඳ කොන්ත්‍රාත්තුවල යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 273.50 ක්වූ මුදලක් හා ඒ සඳහා රු.මිලියන 29.45 ක්වූ රඳවා ගැනීම් මුදල් ගිණුම්ගත කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**2.2.2 නීති,රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන පරිදි වැඩසටහන විසින් සේවයෙහි යොදවා ගන්නා ලද උපදේශකවරුන් තිදෙනෙකුගේ පාරිශ්‍රමික වලින් රු.916,645 ක් වූ උපයන විට ගෙවීම් බද්ද අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව, ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයෙන් රු.204,915 ක් වූ පොදුකාර්ය පිරිවැය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අයකර තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව උපදේශකවරුන් 11 දෙනෙකු හා රාජ්‍ය සම්බන්ධීකරණ නිලධාරීන් තිදෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව බඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුම්වල මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 800 | 104,000 | 11,000 | 48.93 | 6,421 | 48.93 | 6,421 |
| ශ්‍රී ලං ර | 106 | 13,780 | 108 | - | 83 | - | 107 |
| | 906 | 117,780 | 11,108 | 48.93 | 6,504 | 48.93 | 6,528 |

ඉහත තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ කරන ලද රු.මිලියන 11,108 ක් වූ වෙන් කිරීමෙන් රු.මිලියන 6,504 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, වාර්ෂික මූල්‍ය ඉලක්කයන් සැලසුම් කළ පරිදි ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

## 3.2 භෞතික ප්‍රගතිය

--------------------

වැඩසටහනේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂය තුළ දකුණු, සබරගමුව හා මධ්‍යම පළාත්වල කිලෝමීටර් 1,649 ක් වූ පළාත් හා ග්‍රාමීය මාර්ග 429 ක පුනරුත්ථාපන වැඩ ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණු අතර, ඉන් දකුණු පළාතේ, පළාත් හා ග්‍රාමීය මාර්ග 184 ක කිලෝමීටර් 582 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා පමණක් 2015 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. තවද වයඹ, උතුරු මැද හා බස්නාහිර පළාත්වල පළාත් හා ග්‍රාමීය මාර්ගවල පුනරුත්ථාපන වැඩ, ආසියානු සංවර්ධන බැංකුව විසින් අභිලාෂයන් පිළිබඳ ප්‍රකාශයන් නැවත කැඳවීමට උපදෙස් දීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 13,858 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකට දකුණු පළාතේ කිලෝමීටර් 582 ක ග්‍රාමීය මාර්ගවල පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත් පැකේජ 12 ක් යටතේ කොන්ත්‍රාත් 06 ක් ප්‍රදානය කිරීමට වැඩසටහන විසින් පියවර ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ අංක 01 හි ඇතුළත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ නිදිගම්විල - විජිතපුර මාර්ගයේ කිලෝමීටර් 4.2 ක පුනරුත්ථාපන හා නඩත්තු කාර්යයන් පිළිබඳ කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු ඉවත් කරගෙන තිබුණි. කෙසේ වුවද ඒ සඳහා කරන ලද ඉතිරිකිරීම් තීරණය කර කොන්ත්‍රාත් ගිවිසුමේ ගැලපීම් කර නොතිබුණි.

(ආ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ අංක 02 යටතේ මීටර් 200 ක ඇස්පල්ට් උඩින් ඇතිරීම මඟින් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් කිරීමෙන් තොරව හා අදාළ ප්‍රාදේශීය ලේකම්ට ඉඩමේ අයිතිය පැවරීමකින් තොරව රාජපක්ෂ මාවත හරහා ගෝනදිහේනකන්ද මාර්ගය වැඩසටහන විසින් තෝරා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ගයේ පුනරුත්ථාපන වැඩ 2015 දෙසැම්බර් 31 වන විටත් ඉඩම් ආරාවුලක් මත ආරම්භ කර නොතිබුණි.

(ඇ) තවද, කොන්ත්‍රාත් පිරිනැමීමට පෙර, විධිමත් අධ්‍යයනයන් සිදු කිරීම මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් හා ග්‍රාමීය මාර්ග පිළිබඳ පුනරුත්ථාපන වැඩවල වැඩ විෂය පථය වැඩසටහන විසින් හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙරහැර මාවතේ කිලෝමීටර් 0+000 සිට කිලෝමීටර් 2+020 දක්වා කොටසේ පුනරුත්ථාපන වැඩ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ 02 හා කොන්ත්‍රාත් පැකේජ 03 යන දෙකෙහිම ඇතුළත් කර තිබුණි.

(ඈ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාර්ගවල ඇතැම් කොටස්වල පුනරුත්ථාපන කාර්යයන් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය වැඩසටහන් යටතේ නිම කර තිබූ බැවින් පසුව එම මාර්ග පුනරුත්ථාපන වැඩවල දිග ප්‍රමාණය කිලෝමීටර් 11.34 ක් අඩුකර තිබුණි. විධිමත් සමීක්ෂණයන් සිදු කිරීමෙන් පසු මාර්ග පුනරුත්ථාපන සැලසුම් පිළියෙල කර නොතිබූ බවත් ඒ මත අතිරේක වැඩ පූර්ව අත්තිකාරම් කොන්ත්‍රාත්කරුට ලබා ගැනීමට හැකිවන පරිදි අනිසි මූල්‍ය වාසි ලබා දී ඇති බවත් එයින් පැහැදිලි වේ. විස්තර පහත දැක්වේ.

| මාර්ගය | මාර්ගයේ දිග | | |
|---|---|---|---|
| | මුල් සැලැස්ම යටතේ | සංශෝධිත සැලැස්ම යටතේ | සාමාන්‍ය වැඩසටහන් යටතේ පුනරුත්ථාපනය කරන ලද ප්‍රමාණය |
| | කිලෝමීටර් | කිලෝමීටර් | කිලෝමීටර් |
| මොරවක - මීල්ලව මාර්ගය | 2.90 | 2.31 | 0.59 |
| මොරවක - පරගල - දියදාව මාර්ගය | 11.20 | 6.90 | 4.30 |
| බෙරලපනාතර - තලපලකන්ද මාර්ගය | 6.00 | 4.20 | 1.80 |
| මංචගාව - ලැයිම හන්දිය මාර්ගය | 9.50 | 6.85 | 2.65 |
| පට්ටියපොළ - මරකොල්ලිය මාර්ගය | 5.70 | 3.70 | 2.00 |
| | 35.30 | 23.96 | 11.34 |

(ඉ) තවද, පහත සඳහන් මාර්ගවල පුනරුත්ථාපනය කිරීම සඳහා අපේක්ෂිත හා ප්‍රමාණ පත්‍රවල දක්වා තිබෙන දිග ප්‍රමාණයන්, විගණකවරුන් විසින් වැඩ බිම් භෞතික පරීක්ෂාවේදී ගණනය කරන ලද අදාළ මාර්ගවල තථ්‍ය දිග ප්‍රමාණය සමඟ එකඟ වී නොතිබුණි. පළාත් කාර්යාල විසින් පවත්වාගෙන යන මාර්ග ඉන්වෙන්ට්‍රිවල දක්වා ඇති අදාළ මාර්ගවල දිග නිවැරදි නොවන බව තවදුරටත් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| මාර්ගය | මාර්ගවල දිග | |
|---|---|---|
| | ප්‍රමාණ පත්‍ර හා මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව | තථ්‍ය මිණුම් අනුව |
| | කිලෝමීටර් | කිලෝමීටර් |
| මොරවක - මීල්ලව මාර්ගය | 2.9 | 2.40 |
| පට්ටියපොළ - මාරකොල්ලිය මාර්ගය | 5.7 | 3.05 |
| ඕගස්පෙ හන්දිය - මාලිගාතැන්න - ඇත්තුඩුව මාර්ගය | 1.2 | 0.72 |

(ඊ) මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ 03 ක් යටතේ මාර්ග පුනරුත්ථාපන වැඩ 2015 මැයි 18 දින ආරම්භ කරන ලද අතර වැඩසටහනේ උපදේශකවරුන් ස්ථානගතවී තිබුණේ 2015 ජූලි 31 දින දීය. එහි ප්‍රතිඵලයක් ලෙස සැලසුම් හා පුනරුත්ථාපන කාර්යයන් සඳහා උපදේශකගේ එකඟත්වය ලබාගෙන නොතිබුණි.

(උ) පිළිගත් පරිචයන් අනුව, ප්‍රාදේශීය සභාවේ විෂය පථය යටතේ වන ග්‍රාමීය මාර්ගවල පළල මීටර් 03 කින් සමන්විත වන අතර පළාත් සභා විෂය පථය යටතේ පළාත් මාර්ගවල පළල මීටර් 04 කින් සමන්විත වේ. කෙසේ වුවද ග්‍රාමීය මාර්ග හා පළාත් මාර්ග ලෙස වෙන්කිරීමට කටයුතු කිරීමෙන් තොරව මාතර දිස්ත්‍රික්කයේ මාර්ග පුනරුත්ථාපනය සඳහා ප්‍රදානය කරන ලද සියලු කොන්ත්‍රාත් පැකේජ පළල මීටර් 03 ක් සහිත මාර්ග සඳහා ප්‍රදානය කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් පළාත් මාර්ගවල පළල පිළිබඳ අතිරේක වැඩ සඳහා විචලතා ඉල්ලීම් සිදුකිරීමට කොන්ත්‍රාත්කරුවන්ට අවස්ථා සලසා දී තිබුණි.

(ඖ) දකුණු පළාතේ මාර්ග පුනරුත්ථාපන වැඩ පිළිබඳ විගණකවරුන් විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයන්හිදී පහත විස්තර කර ඇති පරිදි තත්ත්ව අසමත්වීම් කිහිපයක් නිරීක්ෂණය විය.

(i) මාතර දිස්ත්‍රික්කයේ අංක 2 දරන කොන්ත්‍රාත් පැකේජය යටතේ හිග්ගොඩ හරහා පෝරඹ පාසැලේ සිට දියලපේ මංසන්ධිය දක්වා ඇස්පල්ට් ඇතිරීම පිළිබඳ තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව, කිලෝමීටර් 0+000 සිට කිලෝමීටර් 0+220 දක්වා මාර්ගයේ ඇස්පල්ට් මාර්ග තලය තද කිරීම් මට්ටම සියයට 94 සිට සියයට 95 දක්වා පැවති අතර එය සම්මත මට්ටම වූ සියයට 98 ප්‍රමාණයට ඉටුකර ගැනීමට නොතිබුණි.

(ii) සම්මත පිරිවිතරයේ වෙළුම 3 හි 506 වගන්තිය අනුව, ඇස්පල්ට් ක්ෂයවීම් ස්ථරයේ (asphalt wearing course) අවම තදකිරීම් වලින් පසුව ඝනකම මිමී 50 ක් විය යුතුය. කෙසේ වුවද මොරවක - පරගල - දියදාව මාර්ගයේ කිලෝමීටර් 5+282 සිට කිලෝමීටර් 5+675 ස්ථානයේ හා ඉබ්බාවල - පංචාලිය - අඳුරුගොඩ මාර්ගයේ කිලෝමීටර් 0+670 සිට කිලෝමීටර් 0+713 දක්වා ස්ථානයේ ඇස්පල්ට් ක්ෂයවීම් ස්ථරයේ (asphalt wearing course) ඝනකම මිමී 28 සිට මිමී 54.4 දක්වා පරාසයක විය.

ඉහත සඳහන් තත්ත්ව අසමත්වීම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු ගන්නා ලද පිළියම් ක්‍රියාමාර්ග පිළිබඳව කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 පරිබාහිර කාර්යයන්**

**---------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට වියපැහැදම් නොකළ ණය ශේෂය මත බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 1.6 කට සමාන එජඩො 12,359 ක මුදලක් අයකර තිබුණු බව නිරීක්ෂණය විය. රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එය වියපැහැදම් කිරීම පිළිබඳ ප්‍රමාදයක් නිසා නොවන බවත්, ණය ලබාදෙන නියෝජිතායතනය විසින් ණය ගිවිසුමේ 2.03 වගන්තිය ප්‍රකාරව බැඳීම් ගාස්තු අයකර ඇති බවත් සඳහන් කර තිබුණි. තවද, ණය ගිවිසුමේ 2.04 වගන්තිය ප්‍රකාරව ණය මුදල් මත පොලිය හා වෙනත් ගාස්තුවලට අමතරව ණය ගැනුම්කරුගේ වියපැහැදම් නොකල ණය ශේෂයෙන් ගාස්තු අයකර ඇති බවත් ඔහු වැඩිදුරටත් දක්වා තිබුණි.

(ආ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (i) වගන්තියට හා කොන්ත්‍රාත් කොන්දේසිවල 14.2 උප වගන්තියට පටහැනිව අසම්භාව්‍යයන් හා ප්‍රමාණ බිල්පත්‍රවල තාවකාලික මුදල් මත වැඩපූර්ව අත්තිකාරම් ගණනය කර තිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 974 ක අවිධිමත් මූල්‍ය වාසියක් කොන්ත්‍රාත්කරුවන්ට හිමි වී තිබුණි.